# ඉස්ලාම්

## 1 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**පළමු වන මුද්‍රණය 2015**
**දෙවන මුද්‍රණය 2016**
**තෙවන මුද්‍රණය 2017**
**සිව්වන මුද්‍රණය 2018**
**පස්වන මුද්‍රණය 2019**
**හයවන මුද්‍රණය 2020**

**සියලු හිමිකම් ඇවිරිණි**

ISBN 978-955-25-0219-4

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මත්තේගොඩ, වාසනාවත්ත පාර, නො. 90 දරන ස්ථානයෙහි පිහිටි
විශ්ව ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

**ආනන්ද සමරකෝන්**

# පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශීර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

### නියාමනය හා අධීක්ෂණය

පී.එන්. අයිලප්පෙරුම
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### මෙහෙයවීම

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### සම්බන්ධීකරණය

එම්. ටී. අබ්දුර් රහුමාන්
සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

අයි. ඒ. එම්. අෆ්සාන්
සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### ලේඛක මණ්ඩලය

එස්. එම්. ආර්. සූදීන්
ගුරු උපදේශක
සහිරා විද්‍යාලය, කොළඹ 10

එම්. එම්. නසීරා
ජ්‍යෙෂ්ඨ ගුරු(ප්‍රාථමික අංශය)
ෆාතිමා මුස්ලිම් බාලිකා විදුහල
කොළඹ 12

එස්. ඒ. සී. එම්. කරාමත්
විශ්‍රාමලත් විදුහල්පති

### සංස්කාරක මණ්ඩලය

ඉසෙඩ්. තාජුදීන්
අධ්‍යක්ෂ
මුස්ලිම් පාසල් සංවර්ධන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. එච්. එම්. නාලීර්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ෆාතිහ් ඉස්ලාම් ආයතනය, තිහාරිය

එන්. ඒ. ධම්මික ජයසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
සිංහල අධ්‍යයන අංශය
රුහුණ විශ්වවිද්‍යාලය

### පරිගණක සහාය, පිටු සැකසුම

එච්. එෆ්. රිස්නා
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඩබ්. ඉසුරි මධුෂානි
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### චිත්‍ර

එම්. ජේ. එම්. මන්සූර්
නියෝජ්‍ය විදුහල්පති
විද්‍යාලෝක මහා විද්‍යාලය, බලංගොඩ

# පටුන


1. බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම් 1
2. අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමු 2
3. අපේ ආරක්ෂකයා අල්ලාහ් ය 4
4. අල්හම්දු ලිල්ලාහ් 5
5. ලා ඉලාහ ඉල්ලල්ලාහ් 7
6. අල්ලාහ් විශ්වාස කරමු 8
7. කලිමා තයියිබා 9
8. පිරිසිදු ව සිටිමු 10
9. නිවස හා අවට පරිසරය 14
10. පන්තිය පිරිසිදු ව තබා ගනිමු 15
11. ආහාර අනුභව කරමු 17
12. ඇඳුම් අඳිමු 20
13. හොඳ දරුවන් ලෙස ජීවත් වෙමු 23
14. දෙමව්පියන්ට ගරු කරමු 25
15. ගුරුවරුන්ට ගරු කරමු 26
16. සමගියෙන් ජීවත් වෙමු 27
17. අපේ නබිතුමා මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් 28
18. සලවාත් කියමු 31
19. අල් කුර්ආනය පාරායනා කරමු 32
20. සූරා අල් ෆාතිහා 34
21. මස්ජිදය 35
22. ඉමාම් ගස්සාලි රහ්මතුල්ලාහි අලයිහි තුමා 39

# 1
# බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

بِسْمِ اللهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

## බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

“පරම දයාවන්ත වූ ද අපරිමිත කරුණාවන්ත වූ ද අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි” කියා පවසමු.

මෙසේ කියන විට අපට අල්ලාහ්ගේ දයාව හා කරුණාව හිමිවෙනවා.

# 2
# අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමු



කියමු අපි සැම
බිස්මිල්ලාහ්

අරඹමු සැම දේ කියා
බිස්මිල්ලාහ්



කෑමට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්

බීමට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්



උගනිමු අපි කියා
බිස්මිල්ලාහ්

ලියමු අපි කියා
බිස්මිල්ලාහ්



ඇඳීමට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්

නින්දට පෙර කියමු අපි
බිස්මිල්ලාහ්

හැම යහපත් වැඩක් ම බිස්මිල්ලාහ් කියා ආරම්භ කරමු. එයින් අල්ලාහ්ගේ දයාව හා කරුණාව ලබා ගනිමු.

# 3
# අපේ ආරක්ෂකයා අල්ලාහ් ය

أَعُوْذُ بِاللهِ مِنَ الشَّيْطَانِ الرَّجِيْمِ

**අඌදු බිල්ලාහි මිනෂ් ෂයිතානිර් රජීම්**

අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු.







# 4
# අල්හම්දු ලිල්ලාහ්

اَلْحَمْدُ لِلّٰهِ



අල්හම්දු ලිල්ලාහ්
සියලු ප්‍රශංසා අල්ලාහ්ට ය.

ස්තුති කරන්නට
අල්හම්දු ලිල්ලාහ්
අප සැම කියනා
අල්හම්දු ලිල්ලාහ්

සතුටෙ දි කියනා
අල්හම්දු ලිල්ලාහ්
ප්‍රශංසා කරන්නට
අල්හම්දු ලිල්ලාහ්

තෑගි ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්
දුක නැති වුණා ම
අල්හම්දු ලිල්ලාහ්

හෙව්ව දේ ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්
ඕනෑ දේ ලැබුණා ම
අල්හම්දු ලිල්ලාහ්

# 5
# ලා ඉලාහ ඉල්ලල්ලාහ්

لَاإِلٰهَ إِلَّااللهُ



**ලා ඉලාහ ඉල්ලල්ලාහ්**

දික්රය පවසමු.

**ලා ඉලාහ ඉල්ලල්ලාහ්**

නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි.

**ලා ඉලාහ ඉල්ලල්ලාහ්**

සලාතය කළ යුත්තේ අල්ලාහ්ට පමණි.

# 6
# අල්ලාහ් විශ්වාස කරමු

අල්ලාහ් ඒකයා ය.

ඔහු කරුණාවන්තයි.

ඔහු අනුකම්පා කරයි.

ඔහු සියල්ල මැව්වේ ය.

ඔහු හැම දේ ම පරිපාලනය කරයි.



හැම දෙයක් ම අපට
දෙන්නේ ඔහුයි.

අපි හැම විට ම
ඔහු නමදිමු.

ඔහුගෙන් ම
දුආ ඉල්ලමු.

# 7
# කලිමා තයියිබා

لَا إِلَٰهَ إِلَّا اللهُ

مُحَمَّدٌ رَّسُوْلُ اللهِ

**ලා ඉලාහ ඉල්ලල්ලාහු**
**මුහම්මදුර් රසූලුල්ලාහි**

# 8
# පිරිසිදු ව සිටිමු I



දත් මදිමු.

අත් පා මුහුණ සෝදමු.





දිය නා ශරීරය පිරිසිදු ව
තබා ගනිමු.

හිස පීරමු.




නියපොතු කපමු.



අල්ලාහ් පිරිසිදු ව ඉන්න අයට කැමති යි.

# පිරිසිදු ව සිටිමු II

වැසිකිළියට යන විට පාවහන් පලඳිමු.



වැසිකිළියට වතුර ගසා පිරිසිදු ව තබමු.

වැසිකිළියට යන්නට
පෙරත් ගොස් ආ පසුත්
පිරිසිදු කර ගැනීම
හොඳ පුරුද්දක්.

මල පහ කළ පසු
සබන් ගා අත් සෝදා ගනිමු.

අන් අයට භාවිත කළ හැකි අන්දමට
වැසිකිළිය පිරිසිදු ව තබමු.

# 9
# නිවස හා අවට පරිසරය



අපි නිවස පිරිසිදු ව හා අලංකාර ව තබමු.
නිවස පිරිසිදු ව තබා ගැනීමට උදවු කරමු.

අපි භාවිත කරන උපකරණ නිසි අයුරින්, පිරිසිදු ව හා අලංකාර ව තබා ගනිමු.

# 10
# පන්තිය පිරිසිදු ව තබා ගනිමු



අපි අපේ පන්තිය පිරිසිදු ව තබා ගනිමු.

එහි ඇති දේ අදාළ තැන්වල ම තබමු.

කුණු, කසළබඳුන්වලට දමමු.

ලී බඩු සහ උපකරණ  පිරිසිදු ව හා ලස්සනට තබා ගනිමු.

වටපිටාව පිරිසිදු ව තබා ගන්න උදවු වෙමු.



එය අලංකාර ව තබා සතුටු වෙමු.

# 11
# ආහාර අනුභව කරමු

කෑමට පෙර අත් සෝදමු.

කෑම කෑමෙන් පසුවත් අත් සෝදමු.

සබන් ගා අත් සෝදමු.





වාඩි වී කෑම කමු.

කෑමට කලින් බිස්මි කියමු.



වතුර බොන විට ටිකෙන් ටික බොමු.



කෑම කෑමෙන් පසුවත්
ජලය බීමෙන් පසුවත්
අල්හම්දු ලිල්ලාහ් කියා අල්ලාහ්ට ප්‍රශංසා කරමු.

# 12
# ඇඳුම් අඳිමු

අපි සතුටු සිතින් ඇඳුම් අඳිමු.

ඇඳුම් ගසා දමා අඳිමු.



දකුණු පසින් ඇඳුම් අඳින්නට පටන් ගනිමු.



වම් පසින් ඇඳුම් ගලවන්න පටන් ගනිමු.



වරක් ඇඳපු ඇඳුම සෝදමු.
ඇඳුම නවා පිළිවෙළට තබමු.

ඇඳුම් අඳින සහ ගලවන වෙලාවට
අදාළ දුආාව උසුරමු.

# 13
# හොඳ දරුවන් ලෙස ජීවත් වෙමු

මම  හැම දා ම උදෑසන අවදි වෙනවා.
අත් පා සෝදා නා පිරිසිදු  වෙනවා.

අල් කුර්ආන් පාරායනයේ යෙදෙනවා.
අනෙක් අයගේ පාරායනා අසා සිටිනවා.






වැඩිහිටියන්ට සලකනවා.
අහල පහළ අයට උදවු වෙනවා.

හොඳ දේ කරන්නට කැමැතියි.
නරක දේවලට මම අකැමැතියි.

ස්වර්ග ජීවිතය පතනවා.
අපා ජීවිතයෙන් වැළකී සිටිනවා.

# 14
# දෙමව්පියන්ට ගරු කරමු



දෙමව්පියන්ට ගරු කරමු.

ඔවුන් කියන දේ ඉටු කරමු.

දෙමව්පියන්ට කීකරු වෙමු.

නැදෑයින් සමග සමගියෙන් ඉඳිමු.

නැදෑයින්ට, අසල්වැසියන්ට උදවු කරමු.

# 15
# ගුරුවරුන්ට ගරු කරමු



ගුරුවරුන්ට ආදරය කරමු.
අපි ඔවුන්ට ගරු කරමු.

ගුරුවරුන්ගේ මගපෙන්වීම අනුව වැඩ කරමු.

## 16
## සමගියෙන් ජීවත් වෙමු

සැවොම හා එක් ව ජීවත් වෙමු.

සමගියෙන් ජීවත් වෙමු.

අන් අය සමග එක් ව කෑම කමු.

මිතුරන් සමග එක් ව සෙල්ලම් කරමු.



# 17
# අපේ නබිතුමා
# මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම්I

මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ දූතයා ය.

එතුමා ඉපදුණේ මක්කා නගරයේ ය.

එතුමාගේ මවගේ නම ආමිනා ය.

පියාගේ නම අබ්දුල්ලාහ් ය.



# අපේ නබිතුමා
# මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් II

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා කුඩා කාලයේ පටන් ම ඇත්ත පමණක් ම කතා කළා.

සැවොම එතුමාට 'අස්සාදික්' කියා කීවා.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා කුඩා කාලයේ පටන් සියලු දෙනා සමග විශ්වාසවන්තව කටයුතු කළා.

සැවොම එතුමාට 'අල් අමීන්' කියා කීවා.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා මදීනාවේ දී වෆාත් වුණා.



අපිත් සැම වෙලේ  ම ඇත්ත කතා කරමු.

විශ්වාස වන්ත ව වැඩ කරමු.

# 18
# සලවාත් කියමු

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමාගේ නම ඇසෙනා විට එතුමා වෙත සලවාත් කියමු.

صَلَّى اللهُ عَلَى مُحَمَّدٍ

صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ

සල්ලල්ලාහු අලා මුහම්මද්

සල්ලල්ලාහු අලයිහි වසල්ලම්

# 19
# අල් කුර්ආනය පාරායනා කරමු



අල් කුර්ආනය අල්ලාහ්ගේ වදන් වේ.

අපේ දේව  ග්‍රන්ථය අල් කුර්ආනයයි.

එය අපට යහ මග පෙන්වන ග්‍රන්ථයයි.

එය නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා වෙත

අල්ලාහ් විසින් පහළ කරන ලදී.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්තුමා අපට එය කියා දුන්නේය.

දිනපතා අල් කුර්ආනය පාරායනා කරමු.



අල් කුර්ආන් පාරායනය අසා සිටිමු.



# 20
# සූරා අල් ෆාතිහා

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ۝

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ ۝١ الرَّحْمٰنِ الرَّحِيْمِ ۝٢

مٰلِكِ يَوْمِ الدِّيْنِ ۝٣ اِيَّاكَ نَعْبُدُ وَاِيَّاكَ نَسْتَعِيْنُ ۝٤

اِهْدِنَا الصِّرَاطَ الْمُسْتَقِيْمَ ۝٥ صِرَاطَ الَّذِيْنَ اَنْعَمْتَ

عَلَيْهِمْ ۙ غَيْرِ الْمَغْضُوْبِ عَلَيْهِمْ وَلَا الضَّآلِّيْنَ ۝٧

සූරා ෆාතිහාව හැම දා ම පාරායනා කරමු.

එයින් අපට අල්ලාහ්ගේ බරකතයත් රහ්මතයත් ලැබෙනවා.

# 21
# මස්ජිදය

මෙය මස්ජිදයකි. මෙය අල්ලාහ්ගේ මාළිගයයි.

අපි මෙහි දී අල්ලාහ් නමදිමු.



මෙය පූජනීය ස්ථානයකි.

හැම වෙලේ ම මස්ජිදය පිරිසිදු ව තබා ගනිමු.

මෙහි නිශ්ශබ්දතාවය සුරකිමු.

පිරිසිදු ව මස්ජිදයට යමු.

මස්ජිදයේ දී ඉමාම්වරයා සලාතය මෙහෙයවයි.

ඉමාම්තුමා සලාතය මෙහෙයවන තැන "මිහ්රාබ්" නම් වේ.

මස්ජිදයේ ධර්ම දේශනා පවත්වනු ලැබේ.
ධර්ම දේශනා පවත්වන තැන "මිම්බර්" නම් වේ.


මස්ජිදයට ඇතුළු වන විට අත් පා සෝදා වුළුඃ කළ යුතුය.

වුළුඃ කිරීමට හව්ල් සාදා තිබේ.



මිහ්රාබ් මිම්බර්

මස්ජිදයේ උස් වූ මිනාරා තිබේ.



අපිත් සලාතය ඉටු කිරීමට දිනපතා මස්ජිදයට යමු.

# 22
# ඉමාම් ගස්සාලි රහ්මතුල්ලාහි අලයිහි තුමා



ඉමාම් ගස්සාලි රහ්මතුල්ලාහි අලයිහි තුමා ලෝක ප්‍රසිද්ධ උගතෙක්. එතුමා ඉපදුණේ පර්සියාවේ. එතුමා ඉගෙන ගන්න බග්දාද් නගරයට ගියා.

දවසක් දා එතුමා බග්දාද් නගරයේ සිට ආපසු එන අතරමග දී සොරුන් කණ්ඩායමක් මුණ ගැසුණා. ඔවුන් එතුමා සතු දේවල් පැහැර ගත්තා.

ඉමාම් ගස්සාලි රහ්මතුල්ලාහි අලයිහි තුමා හුඟක් දුක් වුණා. එතුමා තමාගේ පොත්පත් ආපසු දෙන ලෙස ඉල්ලා සිටියා.

"ඔබ උගත් දේ තියෙන්නේ පොත්පත්වල ද?" කියා සොරුන් ඇහුවා.

ඉමාම් ගස්සාලි රහ්මතුල්ලාහි අලයිහි තුමා කල්පනා කරන්න වුණා. "උගත් දේ පොත්පත්වල පමණක් නොව මතකයේ ද තබා ගන්නට ඕනෑ" කියා එතුමාට තේරුණා.

එතුමා තමා උගත් දේ මතකයේ තබාගෙන ක්‍රියා කළා.

එතුමා වගේ අපිත් ඉගෙන ගත්ත දේවල් මතකයේ තබා ගනිමු.

ඒවා අපේ එදිනෙදා ජීවිතයේ ක්‍රියාවට නංවමු.